# Speed Shrimp Mobile App

**SPEED SHRIMP ජංගම යෙදුම, තිරසාර ආර්ථික වර්ධනය තුළින් ඔබේ සිහින, බලාපොරොත්තු, සහ ඉලක්ක, සව්බල ගන්වයි.**




Speed Shrimp යෙදුම හරහා ඔබට ගණනය කරදෙන ඔබේ පොකුණේ මූල්‍යමය දත්ත හා ඒ හා සබැඳි අනෙකුත් දත්ත පිළිබඳ විස්තරය

1. පසුගිය සතිය වනවිට වගා පොකුණේ ජීවත්ව සිටි ඉස්සන් සංඛ්‍යාව.

   මේ මගින් පසුගිය සතිය වනවිට වගා පොකුණේ ජීවත්ව සිටි ඉස්සන් සංඛ්‍යාව ඔබට ගණනය කරදෙයි. මේ අගය, ඔබ පොකූණේ තැන්පත්කල පැටවුන් සංඛ්‍යාවෙන්, පොකුණ තුළ පසුගිය සතිය වනවිට ජීවත්ව සිටි ඉස්සන් සංඛ්‍යාව හෝ, ඔබ අස්වැන්නෙන් කොටසක් කලින් නෙලාගත්තේනම්, එම අස්වැන්න නෙලීමෙන් පසුව, පොකුණ තුළ පසුගිය සතිය දක්වා ජීවත්ව සිටි ඉස්සන් සංඛ්‍යාව පමණක්වේ.

2. අද දිනට වගා පොකුණේ ජීවත්ව සිටින ඉස්සන් සංඛ්‍යාව.

මේ මගින් අද වනවිට වගා පොකුණේ ජීවත්වන ඉස්සන් සංඛ්‍යාව ඔබට ගණනය කරදෙයි. මේ අගය ඔබ පොකුණේ තැන්පත්කල පැටවුන් සංඛ්‍යාවෙන් පොකුණ තුළ අද දක්වා ජීවත්ව සිටින ඉස්සන් සංඛ්‍යාව හෝ, ඔබ අස්වැන්නෙන් කොටසක් කලින් නෙලාගත්තේනම්, එම අස්වැන්න නෙලීමෙන් පසුව පොකුණ තුළ අද දක්වා ජීවත්ව සිටින ඉස්සන් සංඛ්‍යාව පමණක්වේ.

3. පසුගිය සතිය හා සැසඳීමේදී, අදවනවිට වගා පොකුණේ ජීවත්වෙන ඉස්සන් සංඛ්‍යාවේ වෙනස (සතියට).

පසුගිය සතියේ වගා පොකුණේ ජීවත්වසිටි ඉස්සන් සංඛ්‍යාව හා අදදින වනවිට වගා පොකුණේ ජීවත්වෙන ඉස්සන් සංඛ්‍යාව අතර වෙනස මෙයින් ඔබට පෙන්වාදෙයි. මෙහිදී පසුගිය සතිය හා සැසඳීමේදී, අදවනවිට ජීවත්වසිටින ඉස්සන් සංඛ්‍යාව අතර වෙනස සැලකිය යුතු සංඛ්‍යාවකින් අඩුවී ඇත්නම්, වගා පොකුණ පිලිබඳව ඉතා සමීපව අධ්‍යයනය කර එයට හේතුව සොයා, අවශ්‍යනම් ඉතා ඉක්මනින් වගා පොකුණ පිළිබඳ තීරණයක් ගැනීමට මෙමගින් ඔබට ඉඩකඩ සලසාදෙයි.

4. පසුගිය සතිය හා සැසඳීමේදී, අද වනවිට වගා පොකුණේ ජීවත්වෙන ඉස්සන් සංඛ්‍යාව අතර වෙනසේ ප්‍රතිශතය (සතියට).

පසුගිය සතියේ වගා පොකුණේ ජීවත්වසිටි ඉස්සන් සංඛ්‍යාව හා අද වනවිට වගා පොකුණේ ජීවත්ව සිටින ඉස්සන් සංඛ්‍යාව අතර වෙනස ප්‍රතිශතයක් ලෙස මේ මගින් ඔබට පෙන්වාදෙයි. මේ අගයෙන් ඔබට ගෙවුනු සතිය තුලදී සැලකියයුතු ප්‍රමාණයකින් පොකුණේ ඉස්සන් සංඛ්‍යාව අඩුවී ඇත්නම්, එම සංඛ්‍යාව ගැන නිවැරදි අදහසක් ලබාගැනීම සඳහා වඩාත් ඉවහල්වේ.

5. ගෙවුනු සතිය තුලදී වගා පොකුණේ වෙනස් වූ ඉස්සන් සංඛ්‍යාවේ අගය, තැන්පත්කල පැටවුන් සංඛ්‍යාව හා සැසඳීමේදී වෙනසේ ප්‍රතිශතය.

මේ සතියතුළ වගා පොකුණේ වෙනස් වූ ඉස්සන් සංඛ්‍යාවේ අගය පොකුණේ තැන්පත්කල පැටවුන් සංඛ්‍යාව හා සැසඳීමේදී, මේ සතියතුළ පොකුණේ වෙනස්වූ ඉස්සන් සංඛ්‍යාවේ අගය ප්‍රතිශතයක් ලෙස මේ මගින් ඔබට පෙන්වාදෙයි. මෙයින් ඔබට ගෙවුනු සතිය තුලදී වගා පොකුණේ ඉස්සන් සංඛ්‍යාවේ වෙනස්වීම, තැන්පත්කල පැටවුන් සංඛ්‍යාවෙන් කුමන ප්‍රතිශතයක්ද යන්න අවබෝධ කරගත හැකිවේ. කෙසේ නමුදු මෙම අගයේ වෙනස සතිපතා, සතියට ඍණ සියයට එකයි දශම පහ (-1.5% ) නොඉක්මිය යුතුය. එසේ නොවුනොත්, එය පොකුණේ අවසාන ජීවී ඉස්සන් ප්‍රතිශතයට (final survival rate) අහිතකර ලෙස බලපෑමට බොහෝදුරට ඉඩඇත.

6. අදවනවිට වගා පොකුණේ ජීවී ඉස්සන්ගේ සම්පූර්ණ බර කිලෝග්‍රෑම්.

මේ මගින් ඔබට අද වනවිට වගා පොකුණේ ජීවත්වන ඉස්සන් කිලෝග්‍රෑම් ප්‍රමාණය ගණනය කරදෙයි (Current Biomass). මේ අගය, ඔබ අස්වැන්නෙන් කොටසක් කලින් නෙලාගත්තේ නම්, එම අස්වැන්න නෙලීමෙන් පසුව වගා පොකුණ තුළ ඉතුරුවූ ඉස්සන් සංඛ්‍යාවෙන් අද දක්වා ජීවත්වන ඉස්සන් සංඛ්‍යාවේ බර පමණක්වේ.

7. මේ සතිය තුල වගා පොකුණේ වැඩිවුන හෝ අඩුවුන ඉස්සන්ගේ සම්පූර්ණ බර කිලෝග්‍රෑම්.

මේ සතිය තුළ ඉස්සන්ගේ වැඩිවුණු දේහබර ප්‍රමාණයට අනුකූලව මේ සතිය තුල වගා පොකුණේ වැඩිවුන ඉස්සන්ගේ සම්පූර්ණ බර ප්‍රමාණය කිලෝග්‍රෑම් වලින් ගණනය කරදෙයි. මේ අගය පිළිබඳව ඉතාමත්ම සැලකිලිමත් වියයුතු අතර සතිය තුළදී ඉස්සන්ගේ දේහබර ප්‍රශස්ථ අගයකින් වැඩි නොවුනේනම් හෝ යම්කිසි රෝගකාරකයක් නිසා හෝ ජල පරාමතීන්වල වෙනසක් නිසා හෝ පොකුණේ ඉස්සන්ගේ අඩුවීමකදී, මෙම අගය ඉතා පහළ අගයක් ගැනීමට හෝ ඍන අගයක් ගැනීමට ඉඩකඩ පවතී. එමනිසා එම අගය අඩුවීම ඉස්සන්ගේ දේහබර අඩුවීම නිසාද, එසේ නැතහොත් පොකුණේ ඉස්සන්ගේ අඩුවීමක් නිසා සිදුවුණේදැයි වඩාත් සැලකිල්ලෙන් සොයාබැලිය යුතුවේ. මෙම යෙදුම හරහා පොකුණේ වර්තමාන තත්ත්වය පිළිබඳව ගැඹුරින් විශ්ලේෂණයකර, ලබාදෙන තොරතුරු ඉතා සමීපව අධ්‍යයනය කිරීමෙන්, ඔබට එම හේතුව පහසුවෙන්ම සොයාගත හැකිවේ.

8. පොකුණේ වර්ග මීටරයක්තුල ජීවත්වෙන ඉස්සන් කිලෝ ප්‍රමාණය : carrying capacity - Vannamei ඉස්සන් සඳහා නිර්දේශිත උපරිම අගය වර්ග මීටරයට කිලෝග්‍රෑම් 1.8ක් වේ. Monodon ඉස්සන් සඳහා නිර්දේශිත උපරිම එම අගය වර්ග මීටරයට කිලෝග්‍රෑම් 1.4ක් වේ. )

බහුතරයක් ගොවීන් විසින් නොසලකා හරින නමුත්, වගාවේදී ඉතාමත්ම සැලකිලමත් වියයුතු වැදගත් අගයක්වන මෙය, කිසිවිටකත් නිර්දේශිත උපරිම අගය ඉක්මවා යෑමට ඉඩ නොතැබිය යුතුය. ගොවියා සතුව කුමන නවීන පහසුකම් තිබුණත් මෙම අගය ඉක්මවා යන සෑමවිටම වගාව ඉතා අවදානම් තත්ත්වයකට පත්වේ. මෙම අගය ඉක්මවා යෑමටපෙර අස්වැන්නෙන් කොටසක් නෙළා එම අගය අඩුකරගැනීම හෝ සම්පූර්ණ පොකුණේම අස්වැන්න නෙළාගැනීම කලයුතුය.

9. මේ සතිය තුල පොකුණට පාවිච්චිකල ඉස්සන් ආහාර ප්‍රමාණය.

මේ සතිය තුළ ඔබ වගා පොකුණ සඳහා භාවිතාකළ ඉස්සන් ආහාර ප්‍රමාණය මේ මගින් ගණනය කරදේ, මේ අගය ඉතාමත්ම පහසුවෙන් ඔබටද ගණනය කරගැනීමට හැකි නමුත්, මේ යෙදුම හරහා සිදුකෙරන අනෙකුත් සංකීර්ණ ගණනය කිරීම්වලට එම

අගය පාදක කරගැනීම ඉතා අත්‍යාවශ්‍ය බැවින්, එම අගය ගණනය කිරීමද මෙම යෙදුම හරහා සිදුකෙරේ.

10. මේ සතිය තුල ඉස්සන් කිලෝවක් නිශ්පාදනය කිරීම සඳහා වැයකල ඉස්සන් ආහාර කිලෝ ගනන.

මෙම අගය පිළිබඳව ද ඉතාමත්ම සැලකිලිමත්විය යුතුය. විශේෂයෙන්ම මේ අගය මගින් මේ සතිය සඳහා පොකුණේ ආහාර පරිවර්තිත අගය ( weekly F.C.R.) ගණනය කරදෙන අතර, එම අගය මේ යෙදුම මගින් ගනනය කරදෙන පොකුණේ අවසාන ආහාර පරිවර්ථිත අගය ( final F.C.R.) සමග සැසඳීම මගින්, වගාවේ දිශානතිය සම්බන්ධව ඔබට ඉතා පැහැදිලි අවබෝධයක් ලබාගත හැකිවේ.

11. ඉස්සන් කිලෝවක් නිශ්පාදනය සඳහා මේ සතියේදී වැයවූ මුලු මුදල.

ඉස්සන් කිලෝවක් නිෂ්පාදනය සඳහා මේ සතිය තුළ වැයවූ මුදල මේ මගින් ඔබට ගණනය කරදෙයි (weekly production cost). මේ අගය, මේ යෙදුම මගින් ගනනය කරදෙන, ඉස්සන් කිලෝවක් නිෂ්පාදනය සඳහා සම්පූර්ණ වගා කාලය සඳහාම වැයවූ මුලු මුදල (final production cost) හා සසඳා බැලීමෙන්ද, ඔබට වගා පොකුණේ දිශානතිය පිළිබඳව ඉතා හොඳ අවබෝධයක් ලබාගත හැකිවේ.

12. ඉස්සන් නිශ්පාදනය වෙනුවෙන් සම්පූර්ණ පොකුණ සඳහාම මේ සතියේදී වැයවූ මුලු මුදල.

වගා පොකුණ සඳහා මේ සතියේදී වැයවූ සම්පූර්ණ මුදල මේ මගින් ඔබට ගණනය කරදෙයි. එමෙන්ම මේ යෙදුම හරහා ගණනය කරදෙන මේ සතිය සඳහා පොකුණෙන් ලදහැකි සම්පූර්ණ ආදායම සමග මේ අගය සැසඳීම මගින්ද ඔබට ඔබේ වගාවේ ආර්ථිකමය තත්වය ගැන නිසි අවබෝධයක් ලබාගත හැකිවේ.

13. අද වනවිට වගා පොකුණේ ජීවත්වන ඉස්සන් කිලෝවකින් මේ සතියට ලදහැකි ශුද්ධ ලාභය හෝ ශුද්ධ අලාභය.

මේ මගින් ඔබට අද වනවිට පොකුණේ ජීවත්වන ඉස්සන් කිලෝවකින් මේ සතියට ලදහැකි ශුද්ධ ලාභය පෙන්වාදේ. එමෙන්ම පොකුණේ ඉස්සන්ගේ කිසිම දේහ වර්ධනයක් නොමැති හෝ ඉතා අඩු දේහ වර්ධනයක් සහිත අවස්ථාවලදීත්, පොකුණේ ජීවත්වූ ඉස්සන්ගේ සංඛ්‍යාව සතිය තුලදී සැලකියයුතු ප්‍රමාණයකින් අඩුවී ඇති අවස්ථාවලදීත්, සතිය සඳහා ඉස්සන් කිලෝවකින් සිදුවන ශුද්ධ අලාභය

ද මේ මගින් ගණන් බලාගත හැකිවේ.

14. අද වනවිට වගා පොකුණේ ජීවත්වන ඉස්සන්ගෙන්, මේ සතියට පමණක් පොකුණෙන් ලදහැකි ශුද්ධ ලාභය හෝ ශුද්ධ අලාභය .

මේ මගින් ඔබට අද වනවිට පොකුණේ ජීවත්වන ඉස්සන්ගෙන් මේ සතියට අදාලව සම්පූර්ණ පොකුණෙන් ලැබෙන ශුද්ධ ලාභය බලාගත හැකිවේ. එමෙන්ම පොකුණේ ඉස්සන්ගේ කිසිම දේහ වර්ධනයක් නොමැති හෝ ඉතා අඩු දේහ වර්ධනයක් සහිත අවස්ථාවලදීත්, පොකුණේ ජීවත්වූ ඉස්සන්ගේ සංඛ්‍යාව සතිය තුලදී සැලකියයුතු ප්‍රමාණයකින් අඩුවී ඇති අවස්ථාවලදීත්, සතිය සඳහා පොකුණෙන් සිදුවන සම්පූර්ණ ශුද්ධ අලාභය ද මේ මගින් ගණන්බලා ගතහැක.

15. පසුගිය සතිය වනවිට පොකුණේ ජීවත්වසිටි ඉස්සන්ගේ සම්පූර්ණ වටිනාකම.

පසුගිය සතියේදී ඔබ පොකුණේ සම්පූර්ණ අස්වැන්න නෙලාගත්තේ නම්, පොකුණේ ජීවත්වසිටි ඉස්සන්ගෙන් ඔබට ලබාගත හැකිව තිබූ ආදායම මෙතැනින් ගණනය කරදෙයි. මේ අගය, ඔබ අස්වැන්නෙන් කොටසක් කලින් නෙලාගත්තේ නම්, එමගින් ලද ආදායම හැර, ඉන්පසුව පොකුණේ ඉතුරුවූ ඉස්සන් සංඛ්‍යාවෙන් පසුගිය සතිය දක්වා ජීවත් වූ ඉස්සන්ගෙන් ලැබිය හැකිව තිබූ ආදායම පමණක්වේ.

16. අද වනවිට පොකුණේ ජීවත්ව සිටින ඉස්සන්ගේ සම්පූර්ණ වටිනාකම.

අදදින ඔබ පොකුණේ සම්පූර්ණ අස්වැන්න නෙලාගන්නේ නම්, පොකුණේ ජීවත්වසිටින ඉස්සන්ගෙන් ඔබට ලබාගතහැකි ආදායම මෙතනින් ගණනය කරදෙයි. මේ අගය, ඔබ අස්වැන්නෙන් කොටසක් කලින් නෙලාගත්තේ නම්, ඉන් ලද ආදායම හැර ඉන්පසුව පොකුණේ ඉතුරුවූ ඉස්සන් සංඛ්‍යාවෙන් අදදින දක්වා ජීවත් වූ ඉස්සන්ගෙන් ලැබියහැකි ආදායම පමණක්වේ.

17. අද දිනය වනවිට ඉස්සන්ගේ අපේක්ෂිත සම්මත සාමාන්‍යය දේහබර.

වගා පොකුණේ ජීවත්වන ඉස්සන්ගේ මේවනවිට තිබියයුතු අපේක්ෂිත සම්මත සාමාන්‍යය දේහබර මෙතැනින් පෙන්වාදෙයි. ඉතා හොඳින් පොකුණ පවත්වාගෙන ගියේනම්, මේ වනවිට පොකුණේ ඉස්සන්ගේ තිබියයුතු අපේක්ෂිත සම්මත දේහබරේ සාමාන්‍යය අගය මෙතැනින් පෙන්වාදේ.

18. අද දිනය වනවිට ඉස්සන්ගේ අපේක්ෂිත සම්මත සාමාන්‍යය දේහබර සමග පොකුණේ ඉස්සන්ගේ සත්‍ය සාමාන්‍යය දේහබර අතර වෙනස ග්‍රෑම්.

පොකුණේ ජීවත්වන ඉස්සන්ගේ මේ වනවිට තිබෙන සාමාන්‍යය දේහබර හා අද දිනය වනවිට ඉස්සන්ගේ අපේක්ෂිත සම්මත සාමාන්‍යය දේහබර අතර වෙනස ග්‍රෑම් වලින් මේ මගින් ඔබට ගණනය කරදෙයි. මේ අගය ඉතාමත්ම වැදගත්වන අතර පොකුණේ වර්ධන වේගය සම්බන්ධයෙන් ඉතා පැහැදිලි අදහසක් මේ මගින් ඔබට ලබාගත

හැකිය. සතියෙන් සතිය මේ සාමාන්‍යය දේහබර අතර වෙනසේ පරතරය වැඩිවන්නේනම්, එය පොකුණේ නිෂ්පාදන වියදමට අහිතකර ලෙස බලපෑමට ඉතාවැඩි ඉඩකඩක් පවතී.

19. අපේක්ෂිත සම්මත සාමාන්‍යය දේහබර හා සත්‍ය සාමාන්‍යය දේහබර අතර වෙනස නිසා වගාව ඉදිරියෙන් සිටිනා හෝ පසුපසින් සිටිනා දින ගනන.

වැඩි හෝ අඩු වර්ධන වේගයක් සහිත වගාවන් වලදී නියමිත දිනට, අපේක්ෂිත සම්මත දේහබරට වඩා වැඩි හෝ අඩු සත්‍ය දේහබරක් වගා පොකුණ තුළ පවතිද්දී, එම වැඩි හෝ අඩු දේහබර ග්‍රෑම් ගණන මෙම යෙදුම හරහා දිනවලට පරිවර්තනය කරයි. ඉදිරියෙන් සිටිනා දින වලින් නිෂ්පාදන වියදම සැලකියයුතු ප්‍රමාණයකින් අඩුකරන අතර පසුපසින් සිටිනා දින වලින් නිෂ්පාදන වියදමට අහිතකර වැඩිබරක් එකතුකරයි.

20. ඉස්සන්ගේ අපේක්ෂිත සාමාන්‍යය දේහබර හා සත්‍ය සාමාන්‍යය දේහබර අතර වෙනස නිසා, ඉස්සන් කිලෝවකින් අතිරේකව හිමිවූ ශුද්ධ ලාභය හෝ ඉස්සන් කිලෝවක ශුද්ධ ලාභයෙන් අහිමිවූ මුදල.

වගා පොකුණේ අපේක්ෂිත සාමාන්‍යය දේහබර හා සත්‍ය සාමාන්‍යය දේහබර අතර වෙනස නිසා, ඉස්සන් කිලෝවකට අතිරේකව හිමිවූ ශුද්ධ ලාභය හෝ ඉස්සන් කිලෝවක ශුද්ධ ලාභයෙන් අහිමිවූ මුදල මේ මගින් ගණනය කරදෙයි.

21. ඉස්සන්ගේ අපේක්ෂිත සාමාන්‍යය දේහබර හා සත්‍ය සාමාන්‍යය දේහබර අතර වෙනස නිසා සම්පූර්ණ පොකුණෙන් අතිරේකව හිමිවූ ශුද්ධ ලාභය හෝ ශුද්ධ ලාභයෙන් අහිමිවූ මුදල මේ මගින් ගණනය කරදෙයි.

වැඩි හෝ අඩු වර්ධන වේගයක් සහිත වගාවන් වලදී, නියමිත දිනට අපේක්ෂිත සම්මත දේහබරට වඩා වැඩි හෝ අඩු සත්‍ය දේහබරක් වගා පොකුණතුළ පවතිද්දී, එම වැඩි හෝ අඩු දේහබර ග්‍රෑම් ගණන මෙම යෙදුම හරහා දිනවලට පරිවර්තනය කරයි. ඉදිරියෙන් සිටිනා දිනවලින් නිෂ්පාදන වියදම සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කරන අතර පසුපසින් සිටිනා දිනවලින් නිෂ්පාදන වියදමට අහිතකර වැඩිබරක් එකතුකරයි. ඒ අනුව වර්ධන වේගයට අනුකූලව, සම්පූර්ණ වගා පොකුණෙන් අතිරේකව හිමිවූ ශුද්ධ ලාභය හෝ ශුද්ධ ලාභයෙන් අහිමිවූ මුදල මෙතැනින් ගණනය කරදෙයි.

22. ඉස්සන්ගේ වර්ධන වේගයේ වෙනසට අනුව පොකුණෙන් දිනකට හිමිවූ ශුද්ධ ලාභය හෝ ශුද්ධ ලාභයෙන් අහිමිවූ මුදල මේ මගින් ගණනය කරදෙයි.

වැඩි හෝ අඩු වර්ධන වේගයක් සහිත වගාවන් වලදී නියමිත දිනට, අපේක්ෂිත සම්මත දේහබරට වඩා වැඩි හෝ අඩු සත්‍ය දේහබරක් වගා පොකුණ තුළ පවතිද්දී, එම වැඩි

හෝ අඩු දේහබර ග්‍රෑම් ගණන මෙම යෙදුම හරහා දිනවලට පරිවර්තනය කරයි. ඉදිරියෙන් සිටිනා දිනවලින් නිෂ්පාදන වියදම සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුකරන අතර පසුපසින් සිටිනා දිනවලින් නිෂ්පාදන වියදමට අහිතකර වැඩිබරක් එකතුකරයි. ඒ අනුව වර්ධන වේගයට අනුකූලව වගා පොකුණෙන් අතිරේකව දිනකට හිමිවු ශුද්ධ ලාභය හෝ ශුද්ධ ලාභයෙන් අහිමිවූ මුදල මෙතැනින් ගණනය කරදෙයි.

23. තැන්පත්කල පැටවුන් හා සැසදීමේදී මේ දක්වා ජීවත්වූ ඉස්සන් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස (final survival %).

වගා පොකුණේ තැන්පත්කළ පැටවුන් ප්‍රමාණය හා සැසඳීමේදී අද දක්වා ජීවත්වූ ඉස්සන් සම්පූර්ණ සංඛ්‍යාව ප්‍රතිශතයක්ලෙස මෙතනින් ගණනය කරදෙයි (final survival %). මේ අගය, ඔබ අස්වැන්නෙන් කොටසක් කලින් නෙලාගත්තේ නම්, ඉන් පොකුණෙන් ඉවත්කරගන්නා ලද ඉස්සන් සංඛ්‍යාවේත්, ඉන්පසුව පොකුණේ අදදින දක්වා ජීවත් වූ ඉස්සන් සංඛ්‍යාවේත් එකතුව, වගා පොකුණේ තැන්පත්කළ පැටවුන් ප්‍රමාණය හා සසඳා අද දක්වා ජීවත්වූ ඉස්සන් සම්පූර්ණ සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස මෙතනින් ගණනය කරදෙයි.

24. අද දක්වා සම්පූර්ණම කන්නයටම ඉස්සන් කිලෝවක් නිශ්පාදනය සඳහා වැයවූ සම්පූර්ණ ඉස්සන් ආහාර ප්‍රමාණය.( final FCR ).

ඉස්සන් කිලෝවක් නිෂ්පාදනය කිරීම සඳහා ඔබ වැයකළ ඉස්සන් ආහාර කිලෝ ප්‍රමාණය (final FCR) මෙතනින් ගණනය කරදෙයි. වඩා වැඩි දේහබරකින් යුතු ඉස්සන් නිෂ්පාදනයේදී මෙම අගය ඉස්සන් කිලෝවක් සඳහා ඉස්සන් ආහාර කිලෝ 1.4 - 1.6 අතර අගයක් ගතහැකි වුවත්, සැමවිටම මෙම අගය 1.3 ට වඩා අඩු අගයක පවත්වා ගැනීමෙන් වගා පොකුණෙන් වැඩි ලාභයක් අත්කරගත හැකිවේ.

25. අද දක්වා සම්පූර්ණම කන්නයට ඉස්සන් කිලෝවක් නිශ්පාදනය සඳහා වැයවූ සම්පූර්ණ මුදල (Total production cost).

ඔබ කලින් කොටස් වශයෙන් අස්වනු නෙළාගත්තේ නම්, එම කොටස්ද ඇතුළත්ව ඉස්සන් කිලෝවක් නිෂ්පාදනය කිරීම සඳහා මේ දක්වා වගා පොකුණට වැයවූ සම්පූර්ණ මුදල මෙතනින් ගණනය කරදෙයි.

26. අද දක්වා සම්පූර්ණම කන්නයටම ඉස්සන් කිලෝවකින් ලදහැකි සම්පූර්ණ ශුද්ධ ලාභය හෝ පාඩුව.

ඔබ කලින් කොටස් වශයෙන් අස්වනු නෙළාගත්තේනම්, එම කොටස්ද ඇතුළත්ව අද දිනය වනවිට සම්පූර්ණ පොකුණෙන් ඔබට ඉස්සන් කිලෝවකින් ලබාගත හැකි ශුද්ධ ලාභය හෝ ශුද්ධ පාඩුව මෙතැනින් ගණනය කරදෙයි.

27. අද දිනයට පොකුණෙන් ලදහැකි සම්පූර්ණ ශුද්ධ ලාභය හෝ ශුද්ධ පාඩුව.

ඔබ කලින් කොටස් වශයෙන් අස්වනු නෙළා ගත්තේනම්, එම කොටස්ද ඇතුළත්ව අද දිනය වන විට වගා පොකුණෙන් ඔබට ලබා ගතහැකි සම්පූර්ණ ශුද්ධ ලාභය හෝ ශුද්ධ පාඩුව මෙතැනින් ගණනය කර දෙයි.

28. ඔබ වගාව සඳහා වියදම්කල සම්පූර්ණ මුදලට සාපේක්ශව පොකුණෙන් අද වනවිට ලබාගතහැකි ශුද්ධ ලාභය හෝ ශුද්ධ පාඩුව ප්‍රතිශතයක් ලෙස.

අද දිනය වනවිට වගා පොකුණෙන් ඔබට ලබාගතහැකි සම්පූර්ණ ශුද්ධ ලාභය හෝ ශුද්ධ පාඩුව ඔබ වියදම්කළ මුදලට සාපේක්ෂව ප්‍රතිශතයක් ලෙස මෙතැනින් ගණනය කරදෙයි.

පොකුණට දිනකට ලබාදෙන ඉස්සන් ආහාර ප්‍රමාණය මත පදනම්ව මේ යෙදුම මගින් ගණනය කිරීම් සිදුවන බැවින්, ඉස්සන් සඳහා ලබාදෙන ආහාර ප්‍රමාණය සැමවිටම නිවැරදි විය යුතුය. ආහාර තැටි ඉතා සමීපව නිරීක්ෂණය කිරීම මගින්, ලබාදෙන ආහාර ප්‍රමානය සෑමවිටම යාවත්කාලීන කලයුතුය.

˜ Speed Shrimp ˜ ඔබේ ඉස්සන් ගොවිපල පිළිබඳ සියලුම වැදගත් මෙහෙයුම් තොරතුරු විශ්ලේෂණය කර සැනෙකින් එය ඔබේ ඇඟිලිතුඩු මත තබයි. ක්ලික් කිරීම් කිහිපයක් සමඟින්, ඔබට දැන් ඔබේ වගාව පිළිබඳව අවශ්‍ය සියලුම දත්ත වෙත වේගයෙන් ප්‍රවේශ විය හැක. ඔබට, ඔබගේ ආයෝජනය සඳහා උපරිම ආරක්ෂාවක් සහතික කරගන්නා අතරම බාධාවකින් තොර මූල්‍ය විශ්ලේෂණයන් භුක්ති විඳීමට, ˜ Speed Shrimp ˜ ජංගම යෙදුම දැන් ඔබගේ ස්මාර්ට් ජංගම දුරකතනයේ App Store හෝ Play Store වෙත පිවිස, බාගත කරගන්න.

**සතුටුදායක සහ තිරසාර වගාවේ ප්‍රතිලාභ භුක්ති විඳීමට පටන් ගන්න....!**

